# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1989 අංක 4 දරන ජනසවිය පනත

---

[සහතිකය සටහන් කළේ 1989 මැයි මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1989 මැයි මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 90 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1989 අංක 4 දරන ජනසවිය පනත

[සහතිකය සටහන් කළේ 1989 මැයි මස 10 වන දින]

එල්. ඩී.—ඕ. 8/89.

**ජනසවිය වැඩ සටහන යටතේ මිනිස් ශ්‍රම සම්පත් උපරිම පමණින් ප්‍රයෝජනයට ගැනීමේ ද සමාජ ස්ථායිතාව නංවාලීමේ හා දුගී දුප්පත්කම තුරන් කිරීමේ ද අරමුණින් සහනාධාර ලබා දීමට ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික වූ කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 1989 අංක 4 දරන ජනසවිය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**බදු ගෙවීමෙන් නිදහස් වීම.**

2. ජනසවිය වැඩ සටහන වෙනුවෙන් 1971 අංක 38 දරන මුදල් පනතේ 25 වන වගන්තිය යටතේ, මහා භාණ්ඩාගාරයේ පිහිටුවන ලද අරමුදලට මුදලින් හෝ අන්‍යාකාරයකින් කරන පරිත්‍යාගයක්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත අදාළ කර ගැනීමේ කාර්යයේ දී ආණ්ඩුව විසින් පිහිටුවන ලද අරමුදලකට මුදලින් හෝ අන්‍යාකාරයකින් කරන පරිත්‍යාගයක් වන බව, සැක දුරු කිරීම පිණිස මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

**නිලධරයන් හා සේවකයන් පත් කිරීම.**

3. (1) මේ පනතේ කාර්ය සඳහා, කොමසාරිස්වරයකු, නමින් හෝ නිල නාමයෙන් හෝ පත් කරනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි නියෝජ්‍ය කොමසාරිස්වරයන් සහ සහකාර කොමසාරිස්වරයන් සංඛ්‍යාවක්, නමින් හෝ නිල නාමයෙන් පත් කරනු ලැබිය යුතු ය.

(3) සෑම දිසාපතිවරයකු විසින් ම, ඔහුගේ පත්වීම අදාළ වන පරිපාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන්, නියෝජ්‍ය කොමසාරිස්වරයකු වෙත මේ පනතින් පිරිනමන ලද හෝ නියම කරන ලද හෝ පවරන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ හැකි ය. සෑම උප දිසාපතිවරයකු විසින් ම ඔහුගේ පත්වීම අදාළ වන පරිපාලන කොට්ඨාසය සම්බන්ධයෙන්, සහකාර කොමසාරිස්වරයකු වෙත මේ පනතින් පිරිනමන ලද හෝ නියම කරන ලද හෝ පවරන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ හැකි ය.

(4) (3) වන උපවගන්තියට යටත්ව, මුළු ශ්‍රී ලංකාව ම සඳහා හෝ ශ්‍රී ලංකාවේ යම් කොටසක් සඳහා හෝ යම් නියෝජ්‍ය කොමසාරිස්වරයකු හෝ සහකාර කොමසාරිස්වරයකු හෝ පත් කරනු ලැබිය හැකි ය.

(5) මේ පනතේ කාර්ය පරිපාලනය සඳහා ඉහත කී නිලධරයන්ට සහායවීම පිණිස අවශ්‍ය වන ලිපිකාර සහ කණිෂ්ඨ සේවක කාර්ය මණ්ඩලය ද පත් කරනු ලැබිය හැකි ය.

2—ඩී 004433—8350 (89/04)

නිලධරයන්ගේ බලතල සහ කාර්ය.

4. (1) සෑම නියෝජ්‍ය කොමසාරිස්වරයකු ම සහ සහකාර කොමසාරිස්වරයකු ම සිය බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කාර්ය ඉටු කිරීමේ දී සහ කර්තව්‍ය කිරීමේ දී කොමසාරිස්වරයාගේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත් විය යුතු ය.

(2) සෑම නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් ම හෝ සහකාර කොමසාරිස්වරයකු විසින් ම, කොමසාරිස්වරයාගේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත්ව, සිය පත්වීමේ ප්‍රදේශය ඇතුළත, මේ පනත මගින් හෝ යටතේ හෝ කොමසාරිස්වරයාට පිරිනමා ඇති හෝ නියම කර ඇති හෝ පැවරී ඇති සියලු බලතල, කාර්ය සහ කර්තව්‍ය හෝ ඒවායින් කිසිවක් හෝ ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

සහනාධාර ආදායම් බද්දෙන් නිදහස් බව.

5. මේ පනත යටතේ සාදනු ලැබූ නියෝගවලට අනුකූලව කවර හෝ තැනැත්තකු විසින් මුදලෙන් හෝ අන්‍යාකාරයකින් ලබන යම් සහනාධාරයක් 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ පනවනු ලබන ආදායම් බද්දෙන් හෝ වෙනත් යම් බද්දකින් හෝ නිදහස් වන්නේ ය.

මේ පනත අදාළවීම.

6. මේ පනත යටතේ සාදනු ලැබූ නියෝගවලට අනුකූලව සහනාධාරයක් ඉල්ලුම් කර ඇත්තා වූ හෝ ලබන්නා වූ සෑම තැනැත්තකු ම මේ පනතේ මින් මතු "මේ පනත අදාළ වන තැනැත්තා" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

මේ පනත අදාළවන තැනැත් තකු විසින් කරනු ලබන ප්‍රකාශය.

7. මේ පනත යටතේ සාදනු ලැබූ නියෝග යටතේ සහනාධාරයක් ප්‍රදානය කරනු ලැබීමට සුදුසු ඇයි තීරණය කිරීමේ කාර්යය සඳහා, මේ පනත අදාළ වන සෑම තැනැත්තකුට ම, ඒ තැනැත්තාගේ, ඔහුගේ, කලත්‍රයාගේ, දරුවන්ගේ සහ වෙනත් යැපෙන්නන්ගේ වත්කම් හා බැරකම් ද ඒ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් තොරතුරු ද පිළිබඳ ප්‍රකාශයක්, නියම කරනු ලබන ආකෘතියක සහ ආකාරයකට අනුව කරන ලෙස, කොමසාරිස්වරයා විසින් නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

තොරතුරු ඉල්ලා සිටීමට කොමසාරිස් වරයාට ඇති බලය.

8. 7 වන වගන්තිය යටතේ තමා වෙත කර ඇති යම් ප්‍රකාශයක ඇතුළත් යම් විස්තරයක නිරවද්‍යතාව නිර්ණය කිරීම පිණිස අවශ්‍ය විය හැකි යම් තොරතුරක්, ඇත්වීමෙහි නිශ්චය කොට දැක්වෙන යම් කාලයක් ඇතුළත තමා වෙත සපයන ලෙස කොමසාරිස්වරයා විසින්, කවර හෝ තැනැත්තකුට ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් නියම කරනු ලැබිය හැකි අතර, ඒ නියමය අනුව ක්‍රියා කිරීම, ඒ තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

**9.** මේ පනත අදාළ වන යම් තැනැත්තකු විසින් 7 වන වගන්තිය යටතේ තමා වෙත කර ඇති යම් ප්‍රකාශයක ඇතුළත් යම් විස්තරයක් සම්පූර්ණයෙන් ම හෝ එහි යම් කොටසක් හෝ අසත්‍ය බවට නැතහොත් වැරදි බවට සහ ඒ තැනැත්තාට මේ පනත යටතේ සාදන ලද නියෝග යටතේ සහනාධාර ප්‍රදානය කරනු ලැබීමට හිමිකමක් නොමැති බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වූ අවස්ථාවක, ඒ තැනැත්තාට සහනාධාර ප්‍රදානය කිරීම, 15 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලට හානියක් නොමැතිව, කොමසාරිස්වරයා විසින් වහාම නැවැත්විය යුතු අතර, මේ පනත යටතේ සාදන ලද නියෝගවලට අනුකූලව ඒ තැනැත්තාට ප්‍රදානය කරන ලද යම් සහනාධාරයක වටිනාකම, දැන්වීමෙහි නිශ්චය කොට දැක්වෙන කාලසීමාවක් ඇතුළත ගෙවන ලෙස, ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් ඔහුට නියම කළ යුතු ය.

සහනාධාර නැවැත්වීමට කොමසාරිස්වරයාට ඇති බලය.

**10.** තමාගේ හෝ තමාගේ කලත්‍රයාගේ හෝ දරුවන්ගේ හෝ වෙනත් යැපෙන්නන්ගේ හෝ වත්කම් හා බැරකම් පිළිබඳව 7 වන වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශයක තමා විසින් සපයා ඇති විස්තරවල ඇතිවන යම් වැදගත් වෙනසක්, ඒ වෙනස සිදු වී මාස දෙකක් ඇතුළත කොමසාරිස්වරයාට දැනුම් දීම, එවැනි ප්‍රකාශයක් කර ඇත්තා වූ සහ මේ පනත යටතේ සාදන ලද නියෝග යටතේ සහනාධාරයක් ලබන්නා වූ සෑම තැනැත්තකුගේ ම කාර්යය වන්නේ ය.

වත්කම්වල හා බැරකම්වල ඇතිවන වෙනස් වීම් කොමසාරිස්වරයාට දැනුම් දිය යුතු බව.

**11.** (1) මේ පනත අදාළ වන තැනැත්තකුට දී තිබෙන සහනාධාරය නැවැත්වීමට කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලැබූ අවස්ථාවක, ඔහු විසින් ඔහුගේ තීරණය ඒ තැනැත්තා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

**සිය තීරණය කොමසාරිස්වරයා විසින් දන්විය යුතු බව.**

(2) කොමසාරිස්වරයා විසින් 9 වන වගන්තිය යටතේ කරනු ලබන සෑම තීරණයක් ම, 13 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව, අවසානාත්මක වන්නේ ය.

**12.** (1) සෑම උප දිසාපති කොට්ඨාසයක් සඳහා ම, මේ පනතේ කාර්ය සඳහා, තැනැත්තන් දසදෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකගෙන් සමන්විත අභියාචන මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය. ඔවුන් අතුරින් එක් තැනැත්තකු අභියාචන මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

අභියාචන මණ්ඩලය.

(2) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද සෑම අභියාචන මණ්ඩලයකට ම ලේකම්වරයකු පත් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද සෑම අභියාචන මණ්ඩලයක ම ලේකම්වරයා විසින් ඒ අභියාචන මණ්ඩලයේ රැස්වීම් කැඳවනු ලැබිය යුතු ය. ඒ රැස්වීමක ගණපූරණය තුන් දෙනකු විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද සෑම අභියාචන මණ්ඩලයකම සභාපතිවරයා ඒ අභියාචන මණ්ඩලයේ සෑම රැස්වීමකම මූලාසනය දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටි විටෙක, ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් ඒ රැස්වීම සඳහා, තමන් අතුරෙන් සභාපතිවරයකු තෝරා ගත යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද අභියාචන මණ්ඩලයක රැස්වීමක දී විභාග කරන ලද අභියාචනයක් පිළිබඳව ඒ රැස්වීමේ දී එළඹෙන තීරණය, ඒ අභියාචනය පිළිබඳව, ඒ අභියාචන මණ්ඩලයේ තීරණය ලෙස සැලකිය යුතු ය.

(6) මේ වගන්තියේ මීට ඉහතින් ඇති විධිවිධානවලට යටත්ව, (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද අභියාචන මණ්ඩලයක රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය අභියාචන මණ්ඩලය විසින් නිශ්චය කළ යුතු ය.

13. (1) 9 වන වගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් කරන ලද තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඒ තීරණයට විරුද්ධව අභියාචනයක්, ඒ තීරණය තමා වෙත දැනුම් දෙනු ලැබීමෙන් දවස් විසිඅටක් ඇතුළත තමා පදිංචි උප දිසාපති කොට්ඨාසය සඳහා පිහිටුවන ලද අභියාචන මණ්ඩලය වෙත ඉදිරිපත් කළ හැකි ය.

(2) සෑම අභියාචනයක් ම, ඒ අභියාචන මණ්ඩලය අමතා යවන ලියවිල්ලකින් වූ පෙත්සමක් මගින් ඉදිරිපත් කළ යුතු අතර, අභියාචනයට හේතු වූ කරුණු එහි ගෙනහැර දක්වනු ලැබිය යුතු ය.

(3) අභියාචන මණ්ඩලයක් වෙත (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද අභියාචනයක් පිළිබඳව කටයුතු කිරීමේ දී, අභියාචනය කරනු ලැබ ඇත්තේ කොමසාරිස්වරයාගේ යම් තීරණයකට විරුද්ධව ද, ඒ තීරණය, අභියාචන මණ්ඩලය විසින් ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ ඉවතලීම කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ අභියාචන මණ්ඩලයක් වෙත කරන ලද අභියාචනයක් මත එම අභියාචන මණ්ඩලය විසින් කරනු ලබන තීරණය, එයින් දින විසිඅටක් ඇතුළත කොමසාරිස්වරයාට සහ අභියාචකට දන්විය යුතු ය.

9 වන වගන්තිය යටතේ ගෙවීමට නියම කරන ලද මුදල් ප්‍රදාන අයකර ගැනීම පිළිබඳ විධිවිධාන.

**14.** (1) මේ පනත යටතේ තමාට ප්‍රදානය කරන ලද යම් සහනාධාරයක වටිනාකම වන මුදල් ප්‍රමාණය ගෙවන ලෙස 9 වන වගන්තිය යටතේ වූ දැන්වීමක් මගින් නියම කරනු ලැබූ යම් තැනැත්තකු විසින්, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත ඒ මුදල් ප්‍රමාණය ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක හෝ ඒ මුදල ගෙවන ලෙස ඔහුට නියම කිරීමේ තීරණයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ, ඒ අභියාචනය නිෂ්ප්‍රභ කිරීමෙන් දවස් තිහක් ඇතුළත ඒ මුදල් ප්‍රමාණය ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, දැන්වීමේ නිශ්චිතව සඳහන් මුදල් ප්‍රමාණය ගෙවීම පැහැර හැර ඇති මුදල් ප්‍රමාණයක් ලෙස සහ ඒ මුදල් ප්‍රමාණය ගෙවීම කළ යුතු තැනැත්තා පැහැර හරින්නකු ලෙස, මේ පනතේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(2) (අ) යම් මුදල් ප්‍රමාණයක් ගෙවීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක ගෙවීම පැහැර හැරිය මුදල් ප්‍රමාණය පිළිබඳ විස්තර සහ ඒ මුදල් ප්‍රමාණය ගෙවීම කළ යුතුව ඇති පැහැර හරින්නාගේ නම ඇතුළත් සහතිකයක්, කොමසාරිස්වරයා විසින්, පැහැර හරින්නා පදිංචිව සිටින්නා වූ හෝ පැහැර හරින්නාට අයත් යම් චංචල දේපළක් පිහිටියා වූ කොට්ඨාසයක් කෙරෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණයක් වෙත නිකුත් කරනු ලැබිය හැකි ය.

(ආ) (අ) ඡේදය යටතේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයක පැහැර හරින්නාට මේ පනත යටතේ ප්‍රදානය කරන ලද සහනාධාරයේ වටිනාකම සම්බන්ධයෙන් ඇති යම් ප්‍රකාශයක නිරවද්‍යතාව, කිසිදු අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(ඇ) මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ සහතිකයක් ලැබුණු විට, සහතිකයේ නිශ්චිතව සඳහන් මුදල් ප්‍රමාණය අයකර ගැනීම සඳහා පැහැර හරින්නාට විරුද්ධව තවදුරටත් නඩු කටයුතු කරගෙන නොයා යුත්තේ මන්දැයි නිදහසට කරුණු දක්වනු පිණිස මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ පැහැර හරින්නා තමා ඉදිරියට කැඳවනු ලැබිය යුතු ය ; තව ද ප්‍රමාණවත්ව නිදහසට කරුණු දක්වනු නොලැබුවහොත්, ඒ මුදල් ප්‍රමාණය බන්ධනාගාරගත කිරීමේ දඬුවමකින් දඬුවම් කළ නොහැකි සහ දඩයකින් පමණක් දඬුවම් කළ හැකි වරදක් සම්බන්ධයෙන් ඒ පැහැර හරින්නාට මහෙස්ත්‍රාත්වරයාගේ දණ්ඩන නියමයකින් පනවන ලද දඩයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එවැනි වරදක් සම්බන්ධයෙන් පනවන ලද දඩයක් ගෙවීම පැහැර හැරීමකට අදාළ වන 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන (ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ආ), සහ (ඪ) ඡේද වල විධිවිධාන හැර) එවිට අදාළ විය යුතුය ; තව ද ඒ උපවගන්තියේ විධිවිධාන අනුව එවැනි දණ්ඩන නියමයක් පනවන අවස්ථාවේ දී මහෙස්ත්‍රාත්වරයා විසින් කරනු ලැබිය හැකිව තිබුණු යම් විධානයක්, මහෙස්ත්‍රාත්වරයා විසින් කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් සහතිකයක් නිකුත් කරනු ලබන කවර වූ හෝ අවස්ථාවක ඒ බව දක්වෙන නිවේදනයක්, පෞද්ගලිකව භාර දීමෙන් හෝ තැපැලෙන් යවන ලියාපදිංචි කළ ලිපියක් මගින් හෝ විදුලි පණිවුඩ මාර්ගයෙන් හෝ ඔහු විසින් පැහැර හරින්නා වෙත වහාම නිකුත් කරනු ලැබිය යුතු නමුත්, මේ වගන්තිය යටතේ කරනු ලබන නඩු කටයුතු, එවැනි නිවේදනයක් පැහැර හරින්නා විසින් නොලැබීමේ හේතුවෙන් නිර්බල නොවිය යුතු ය.

වැරදි. 15. (1) 7 වන වගන්තිය යටතේ කරනු ලබන යම් ප්‍රකාශයක, තමාගේ හෝ තම කලත්‍රයාගේ හෝ දරුවන්ගේ හෝ යැපෙන්නන්ගේ හෝ වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් අසත්‍ය හෝ වැරදි බව දැන දැනම, යම් විස්තරයක් කරන කවර හෝ තැනැත්තෙක්, මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු එකකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

(2) 7 වන වගන්තිය යටතේ ප්‍රකාශයක් කර ඇත්තා වූ සහ මේ පනත යටතේ සහනාධාරයක් ලබන්නා වූ තැනැත්තකු ව සිටිමින්, එම ප්‍රකාශයෙහි—

(අ) ඔහුගේ වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් ; හෝ

(ආ) ඔහුගේ කලත්‍රයාගේ, දරුවන්ගේ හෝ වෙනත් යැපෙන්නන්ගේ වත්කම් හා බැරකම් සම්බන්ධයෙන්,

සපයන ලද විස්තරවල ඇති වූ යම් වැදගත් වෙනසක් සිදු වී මාස දෙකක කාලසීමාවක් ඇතුළත, ඒ වෙනස පිළිබඳව කොමසාරිස්වරයාට දැනුම් දීම යුක්ති සහගත හේතුවක් නොමැතිව නොකර හරින කවර හෝ තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙදහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු එකකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

(3)(අ) 8 වන වගන්තිය යටතේ තමා වෙත එවන ලද දන්වීමක නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරින ;

(ආ) එවැනි දැන්වීමක නියමයන් අනුව ක්‍රියා කිරීමේ දී යම් අසත්‍ය හෝ වැරදි තොරතුරක් දැනුවත්ව සපයන

කවර හෝ තැනැත්තෙක්, මෙ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහසකට නොවැඩි දඩයකින් දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේ ය.

(4) (අ) මේ පනත යටතේ තම කර්තව්‍ය ඉටු කරන යම් නිලධාරයකුට ප්‍රතිරෝධය පාන හෝ බාධා කරන, අයුතු ලෙස මැදිහත් වන හෝ මැදිහත් වීමට තැත් කරන හෝ බල පෑමක් කරන ;

(ආ) මේ පනත යටතේ අසත්‍ය ප්‍රකාශයක් කිරීමට යම් තැනැත්තකු පොළඹවන හෝ පෙළඹවීමට තැත් කරන කවර හෝ තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් වන්නේ ය.

(5) මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය කරන කවර හෝ තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසකට නොවැඩි දඩයකින් දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේ ය.

16. (1) පහත දැක්වෙන කරුණු සියල්ල ම හෝ ඉන් කිසිවක් හෝ සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය :— නියෝග.

(අ) නියම කරනු ලැබීමට මේ පනතෙහි නියම කර හෝ බලය දී ඇති සියලු කරුණු ;

(ආ) යම් පුද්ගලයකුට හෝ පවුලකට හෝ ජනසවිය වැඩ සටහන යටතේ සහනාධාර ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් පිළිබඳ කොන්දේසි ;

(ඇ) එම සහනාධාර සඳහා කොමසාරිස්වරයා වෙත ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය ; සහ ඒ ඉල්ලුම්පත් යැවිය යුත්තේ කවර නිලධරයන්ට ද යන වග ;

(ඈ) අරමුදලෙන් සහනාධාර ප්‍රදානය කරන ලෙස ඉල්ලුම් කරන තැනැත්තන් විසින් පිළිපැදිය යුතු කොන්දේසි සහ ඒ සහනාධාර යෙදිය හැක්කේ කවර කාර්ය සඳහා ද යන වග ;

(ඉ) ජනසවිය වැඩ සටහන යටතේ සහනාධාර ලැබීමට සුදුසුකම් ඇති තැනැත්තන්ට සහනාධාර ප්‍රදානය කළ යුතු ආකාරය හා පිළිවෙල ;

(ඊ) එම සහනාධාර ප්‍රදානය කරනු ලබන්නේ (එම සහනාධාර සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් හෝ නියමිත බැංකු ආයතනයක තැන්පත් කිරීම පිළිබඳ සහ එම තැන්පතු ආපසු ගත හැක්කේ කවර කාලසීමාවක් ඇතුළත ද සහ කවර කාර්යයක් සඳහා ද යන්න පිළිබඳ කොන්දේසි ද ඇතුළුව) කවර කොන්දේසිවලට යටත්ව ද යන වග ;

(උ) මේ පනතේ කාර්ය සඳහා නිකුත් කරනු ලැබීමට හෝ කරනු ලැබීමට නියමිත සියලු දැන්වීම්වල සහ ප්‍රකාශවල ආකෘතිය ;

(ඌ) එම සහනාධාර ප්‍රදානය කිරීම සඳහා තාවකාලිකව හඳුනා ගන්නා ලද තැනැත්තන්ගේ ලැයිස්තු, කලින් කල පළ කිරීම ;

(එ) එවැනි යම් ලැයිස්තුවක යම් තැනැත්තකුගේ නම ඇතුළත් කිරීම සම්බන්ධයෙන් විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා විධිවිධාන.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලබන දිනයේ දී හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් යම් පසු දිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකිතාක් ඉක්මණින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ එවැනි යම් නියෝගයක්, අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සැලකිය යුතු නමුත්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය. නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල පාඨය බල පැවැත්විය යුතු බව.

**17.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් සිංහල පාඨය බලපැවැත්විය යුතු ය.